පොදු චක්‍ර ලේඛ 01/2022

මාගේ අංකය-DCDSP/02/18/03
සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
පෙට්ටිගලවත්ත, ගාල්ල
2022/06/30

දකුණු පළාතේ විවිධ සේවා සමූපකාර සමිති ඇතුළු
සියලුම සමූපකාර සමිතිවල ගරු සභාපතිවරුන් වෙත,

සමූපකාර සමිති අනුගමනය කල යුතු වත්කම් මිලදී ගැනීම , බැහැර කිරීම හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය

උක්ත කරුණට අදාළව මා විසින් නිකුත් කරන ලද 2018.05.18 දිනැති අංක දපස/සමූ.සං/සං./18 දරණ පොදු චක්‍රලේඛ/02/2018 චක්‍රලේඛයේ 09 වගන්තියේ සඳහන් මාගේ පූර්ව අනුමැතිය ලබා නොගෙන සිදු කර ඇති දේපළ අත්පත් කර ගැනීම් හෝ බැහැර කිරීම් සඳහා විශේෂ අනුමැතියක් ලබා දීමේ හැකියාව පිළිබඳ සලකා බැලීමේ කාල සීමාව මාගේ සමාංක 2020.08.19 දිනැති ලිපිය මගින් 2020.12.31 දින දක්වාද, සමාංක 2021.02.05 දිනැති ලිපිය මගින් 2021.06.30 දින දක්වාද, 2021.10.11 දිනැති ලිපිය මගින් 2021.12.31 දින දක්වාද වරින් වර දීර්ඝ කරන ලදී.

02. එමෙන්ම මාගේ අංක දපස/සමූ.සං/සං/18 දරණ 2020.08.19 දිනැති ලිපියේ 03 ඡේදයෙහි දක්වා ඇති පරිදි මාගේ පූර්ව අනුමැතිය ලබා නොගෙන සිදු කර ඇති දේපළ අත්පත් කර ගැනීම් හෝ බැහැර කිරීම සඳහා විශේෂ අනුමැතියක් ලබා දීම 2018.05.18 දිනට පෙර සිදු කර ඇති දේපළ අත්පත් කර ගැනීම් හෝ බැහැර කිරීම් සඳහා පමණක් අදාළ වේ.

03. එහෙත් පසුගිය කාල සීමාවේ රට තුල ව්‍යාප්තව පැවැති COVID 19 වසංගත තත්වය හේතුවෙන් එම කාල සීමාව තුළ, ඉහත දැක්වූ ආකාරයේ දේපළ අත්පත් කර ගැනීම්, ඉදි කිරීම් හෝ බැහැර කිරීම් සඳහා විශේෂ අනුමැතියක් ලබාගැනීම සම්බන්ධ ගොනු සකස් කිරීමට හා ඒවා ඉදිරිපත් කිරීමට නොහැකි වූ බවත්, එබැවින් එවැනි ඉල්ලීම් සඳහා විශේෂ අනුමැතියක් ලබා දීමේ හැකියාව පිළිබඳ සලකා බැලීමේ කාල සීමාව තවදුරටත් දික් කරන ලෙසත් සමූපකාර සමිති විසින් මා වෙත දිගින් දිගටම ඉල්ලීම් සිදු කර ඇත.

04. ඒ අනුව එම ඉල්ලීම් සලකා බලා උක්ත කරුණ සම්බන්ධයෙන් මාගේ සමාංක 2021.10.11 දිනැති ලිපිය මගින් දක්වා ඇති කාල සීමාව 2022.12.31 දින දක්වා දීර්ඝ කරමි.

05. එමෙන්ම මාගේ දපස/සමූ.සං/සං/18 දරණ 2020/08/19 දිනැති ලිපියේ 03 වන ඡේදය අනුව මාගේ පූර්ව අනුමැතිය ලබා නොගෙන සිදු කර ඇති දේපළ අත්පත් කර ගැනීම් හෝ බැහැර කිරීම් සඳහා විශේෂ අනුමැතියක් ලබා දීම 2018.05.18 දිනට පෙර සිදු කරන ලද ඉහත ආකාරයේ අත්පත් කර ගැනීම් හෝ බැහැර කිරීම් සඳහා පමණක් අදාල වන බව දක්වා තිබුනද සමූපකාර සමිති මා වෙත කරන ලද ඉල්ලීම් සලකා බලා එම දිනය 2022.06.30 ලෙසටද ඒදින හෝ එදිනට පෙර සිදු කරන ලද අත්පත් කර ගැනීම් හෝ බැහැර කිරීම් වලට අදාළ ගොනු මා වෙත ඉදිරිපත් කල යුතු අවසාන දිනය 2022.12.31 දිනය දක්වා ද ලෙස මෙයින් සංශෝධනය කරමි.

06. තවද මෙම ලිපියේ 05 වන ඡේදයේ දක්වා ඇති දින පිළිබඳ වන සංශෝධනයන්ට යටත්ව මාගේ සමාංක 2020.08.19 දිනැති ලිපියේ 03 හා 04 ඡේදයේ සඳහන් විධි විධාන තවදුරටත් නොවෙනස්ව මේ සම්බන්ධයෙන් අදාළ වන බවත්, නැවත කිසිදු හේතුවක් මත මෙම කාල සීමාව දීර්ඝ නොකරන බවත් කාරුණිකව දන්වමි.

07. සමූපකාර සමිති විසින් වත්කම් අත්පත් කර ගැනීමේදී හෝ බැහැර කිරීමේදී විධිමත් ක්‍රියාවලියට පටහැනිව කටයුතු කිරීමෙන් සමිතියට යම් මූල්‍ය අලාභයක්/හානියක් සිදුවී ඇති බව ඒ පිළිබඳව සිදු කරන පරීක්ෂණයකදී අනාවරණය වුවහොත් අදාල අලාභය/හානිය ඇති විමට පදනම් වූ තීරණය ගැනීමට සම්බන්ධ වූ අය විසින් සමිතියට සිදුව ඇති මූල්‍යමය හානිය/ අලාභය පිළිබඳ වූ වගකීම තනි තනිව හා/හෝ සාමූහිකව දැරිය යුතු බවද මෙයින් අවධාරණය කරමි.

08. තවද 2022.06.30 දිනට පෙර සමූපකාර සමිති විසින් සිදු කරන ලද වත්කම් මිලදී ගැනීම හා බැහැර කිරීම් සඳහා විශේෂ අනුමැතිය ලබා දීමේ හැකියාව ම විසින් නියම කර ඇති සීමාවන්ට යටත්ව දිස්ත්‍රික් සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස්වරු සතු වන බැවින් ඊට අදාල ඉල්ලීම් තම දිස්ත්‍රික්කය භාර සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් වෙත ඉදිරිපත් කරන ලෙසද වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

ටී.ජී.සරත් කුමාර,
සමූපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්,
සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
දකුණු පළාත

ටී. ජී. සරත් කුමාර
සමූපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්
සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
දකුණු පළාත

පිටපත්

1. සහකාර කොමසාරිස් (ප්‍රධාන කාර්යාලය/ගාල්ල/මාතර/හම්බන්තොට)-කාරු. දැ.පි. හා අ.ක.ස
2. සියළුම දිස්ත්‍රික් නිලධාරීන් - කාරු. දැ.පි. හා අ.ක.ස
3. සියළුම මූලස්ථාන සංවර්ධන නිලධාරීන් - කාරු. දැ.පි. හා අ.ක.ස
4. සියළුම සමූපකාර සංවර්ධන නිලධාරීන් - කාරු.දැ.පි. හා සමූ. සමිති දැනුවත් කිරීම සඳහා